## අලව්ව ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටු කරන අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 148 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.06.05 දින තීරණ අංක 3325 ඒ යටතේ මම තීරණය කරමි. එනම් :

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2025 වර්ෂය සඳහා වන මෙම බද්ද අලව්ව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2024 ජූලි මස 01 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

### යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2025 වර්ෂයේ දී පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි 11 වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

### *උපලේඛනය*

| | *1 වන තීරුව* | *II වන තීරුව* |
|---|---|---|
| | | *රු. ශත* |
| (1) (i) | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම | 25 0 |
| (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා- | |
| | (අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | (ආ) වෙළඳ කාර්යය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | 4 00 |
| (iii) | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| (iv) | සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| (v) | සෑම රික්ෂෝවක් සඳහා | 07 50 |
| (vi) | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| (vii) | සෑම ඇතෙකු සඳහා | 50 0 |

(2) විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

08 - 21/3